www.kidworship.kr

# සැම්සන්

– 19th Story–


129Page

පොතේ ගුරා ඉශ්රායෙල් ජනතාව දෙවියන්වහන්සේට විරුද්ධව පව් කළා.
ඒ හේතුව දෙවියන්වහන්සේ ඔවුන්ව පිලිස්තිවරුන්ගේ අත්වලට භාර දුන්නා. එක දවසක් එක් දේවදූතයෙක් පැමිණ මනෝවාගේ ගෙදරට පැමිණ ඔහු ඉදිරියේ දර්ශනය වුණා.
මනෝවා දරුවන් නොමැතිව සිටි ඉශ්රායෙල් මිනිසෙකි.

දේවදූතයා ඔබ පුතකු ලබන්නට යනවා. නමුත් ඔහුගේ කොණ්ඩය නොකැපිය යුතුයි.
මේ ළමයා ඉශ්රායෙල් ජනතාව මුදාගන්නට තෝරාගත් කෙනෙකි.

පොතේ ගුරා මනෝවා සහ ඔහුගේ භාර්යාව ඉතාම ප්‍රීතියට පත් වුණා.
කලකට පසු මනෝවාගේ භාර්යාව ගර්භණී වී පසුව පුත්‍රයෙකු බිහි කළා.
ඔහුගේ නම සැම්සන්. සැම්සන් ඉතාම ශක්තිමත් මිනිසෙක් ලෙස වර්ධනය වුණා. දෙවියන්වහන්සේ සැම්සන් ළඟ සිටිමින් ඔහුට ආශිර්වාද කළා.
සැම්සන්ගේ කොණ්ඩය ඉතාම දිගට වැඩුණා.
නමුත් ඔහුගේ දෙමව්පියන් එය කැපුවේ නෑ.
මන්ද දේවදූතයා ඔවුන්ට එසේ කියා තිබුණ නිසා.

.........................................................................................


130Page

පොතේ ගුරා සැම්සන් වර්ධනය වී ඉතාම ශක්තිමත් මිනිසෙක් වුණා. පිලිස්තිවරු ඔහුගේ ශක්තියට භය වුණා. සිංහයෙකු තමාගේ අත්වලින් ඉරා දමන්නට තරම් සැම්සන් ශක්තියෙන් බලවත්ව සිටියා.
දවසක් ඔහු නරි **300** ක් අල්ලා. ඔවුන්ගේ වලිගයේ පන්දම් ගැටගසා පිලිස්තිවරරන්ගේ කෙත්වලට යැව්වා.
ඔවුන්ගේ කෙත් සියල්ලම ඒ ගින්නෙන් විනාශ වුණා.

පොතේ ගුරා සැම්සන්ගේ මෙවැනි ක්‍රියා හේතුවෙන් පිලිස්තිවරුන්ගේ කෝපය වැඩිවෙලා ඉශ්රායෙල්ට තවත් පීඩා කරයිදෝ කියා ඉශ්රායෙල්වරු බය වුණා. ඒ නිසා ඉශ්රායෙල්වරු සැම්සන්ව අල්ලලා, ගැටගහලා පිලිස්ති-වරුන්ටම බාර දුන්නා. නමුත් දෙවියන්වහන්සේගේ බලය ඇවිත්, සැම්සන් තුළ ක්‍රියා කරන විටදී ඔහු ඒ රැහැන් සියල්ල කඩා දැමුවා.

සැම්සන් මෙන්න කොටලු හක්කක් !

පොතේ ගුරා සැම්සන් කොටලු හක්ක ගෙන එයින් ගසා පිලිස්ති මිනිසුන් **1000** ක් මැරුවා.

.........................................................................................


131Page

පොතේ ගුරා පිලිස්ති කාන්තාවක් වන දෙලීලා නම් කාන්තාවට සැම්සන් ආදරේ කළා.
දෙලීලා මුදල් වලට කෑදර කාන්තාවකි. එක දවසක් නිදාගෙන සිටිය දී පිලිස්ති නායකයන් පැමිණ දෙලීලාට රහසින් මෙසේ කතා කළා.

නායකයන් දෙලීලා... සැම්සන්ගේ ශක්තියේ රහස කුමක්ද කියා අපිට හොයා ගන්න ඕන. ඔබට පුළුවන්, නම් මේ රහස හොයාගන්න. එවිට අපිට පුලුවන් ඔහුව අල්ලා ගන්නට. ඔබ මේ දේ වෙනුවෙන් අපිට උදව් කළොත්, අපි ඔබවත් ගොඩාක් පොහොසත් කරන්න කැමතියි.

**පොතේ ගුරා** ඒ දවස් වලදී කොහොම හරි සැම්සන්ගෙන් මේ ශක්තියේ රහස සොයාගන්නට දෙලීලා උත්සහ කළා.
ඒ ගැන ඔහුගෙන් නිතර නිතරම විමසුවා.

**දෙලීලා** සැම්සන් ! ඔයාගේ ශක්තියේ රහස මොකක්ද ?
ඒක තියෙන්නේ කොහේද ?

**පොතේ ගුරා** සැම්සන්, මේ පිලිස්ති කාන්තාව සමග ඒ රහස බෙදාගත්තේ නෑ.

**සැම්සන්** කවුරුහරි නොවේලාපු අලුත් රැන් 7 කින් මා බැන්දොත් මා බෙලහීනව දුර්වල මිනිසෙකු මෙන් වෙනවා ඇත.

**පොතේ ගුරා** මෙය ඇසූ දෙලීලා, සැම්සන් නිදාගත්තායින් පසුව නොවේලාපු අලුත් රැන් 7 කින් ඔහුව ගැට ගැසුවා.

.................................................................................................


132Page

**පොතේ ගුරා** ඊට පස්සේ ඇය ශබ්ද නගා කෑ ගැසුවා. ඇවිත් අල්ලන්න... යි කියා.

**දෙලීලා** සැම්සන්, ! අපි දැන් කරන්නේ මොකක්ද ?
පිලිස්තිවරුන් ඔයාව අල්ලන්ට ඇවිත් සිටිනවා.


**පොතේ ගුරා** සැම්සන්, හණ නූලක් ගින්නේ තැවරෙන විටම කැඩෙන්නාක් මෙන් ඒ රැන් කඩා දැමුවා. ඒත් දෙලීලා තමුන්ගේ උත්සහය අත්හැරියේ නෑ.
ඊට පසුවත් සැම්සන්ගේ මේ රහස දැනගන්නා පිණිස දෙලීලා දිගින් දිගටම ඔහුට ඇවිටිලි කළා.

**සැම්සන්** කිසි වැඩකට පාවිච්චි නොකළ අලුත් කඹ වලින්, මා බැන්දොත් මා බෙලහීනව දුර්වල මනුෂ්‍යයකු මෙන් වෙනවා ඇත.
නුඹ මාගේ හිසේ සැඩපළු 7 නූල් වියමනක් මෙන් ගෙතුවොත් මමත් අනිත්

**පොතේ ගුරා** මිනිස්සු වගේම වෙනවා. දෙලීලාගේ මනසේ මුදල්වලට තිබුණ කෑදරකම නිසා, සැම්සන් කියපු හැම දෙයක්ම කළා.
නමුත් ඒ කිසිවකින් සැම්සන් දුර්වල වුණේ නෑ. - සැම්සන් බොරු කියමින්

**දෙලීලා** ඇයව රවටන බව දෙලීලා තේරුම්ගත්තා. දෙලීලා ඉතාම කෝපයෙන් සැම්සන්ට කතා කළා. සැම්සන් ඔයා බොරුකාරයෙක්.
මට ආදරේ කරනවා කියලා, ඔයා මට බොරු කියන්නේ කොහොමද ?
ඔයාගේ ශක්තිය තියෙන්නේ කොහේද කියලා මට කියන්න.

.................................................................................................


133Page

**පොතේ ගුරා** ඉන්පසු හැමදාම, ඇයගේ වචනවලින් ඔහුට බල කරමින් මැරෙන තරම් කරච්චල් කළ නිසා, සැම්සන් ඒ රහස දෙලීලාට කිවුවා.

**නායකයන්** දෙලීලා, මා මව් කුස පටන්ම කැපවූ නාසරියෙකි. දැලි පිහියක් මගේ හිසට ලං නොකළේය. මගේ හිස බූ ගෑවොත් මගේ ශක්තිය මගෙන් නැතිවී යනවා. මා බෙලහීනව අන් මිනිසුන් වගේම දුර්වල මනුෂ්‍යයෙක් වෙනවා.

**පොතේ ගුරා** ඒ ඇසූ දෙලීලා, සැම්සන් නිදාගත් විටදී, ඔහුගේ කොණ්ඩය කපා දැමුවා.
එවිට ඔහුගේ ශක්තිය ඔහුගෙන් පහව යන්නට වුණා.



134Page

**පොතේ ගුරා** පිලිස්තිවරුන් පැමිණ ඔහුව ගැටගසා ඔහුට පීඩා කරන්නට පටන් ගත්තා. එවිට සැම්සන් ශක්තියෙන් නැගිටින්ට බැලුවත් ඒ වන විට ස්වාමින්වහන්සේගේ බලය ඔහු වෙතින් අහක්ව ගොස් තිබුණා.

පිලිස්තිවරු ඔහුව අල්ලා, ඔහුගේ ඇස් උගලා, පිත්තල දම්වැල් වලින් බැඳ හිරගෙයි ඇඹරුවේය.

අනේ කෙතරම් දුකක්ද? ...... නමුත් කාලයත් සමග ඔහුගේ කොණ්ඩය නැවත වැවෙන්නට පටන් ගත්තා. පිලිස්තිවරු සැම්සන්ව අල්ලාගත් ප්‍රීතියට උත්සවයක් පවත්වා එය සමරන්නට වුණා.

**1 මිනිසා** ආ... අපි අන්තිමට සැම්සන්ව ඇල්ලුවනේ... අපි ඇස් දෙකත් ගැළෙව්වා. හි හි... දැන් ඔහු හිරේ අඹරනු ලබනවා.


**2 මිනිසා** මොකක්ද? ඒක ඇත්තක් ද ? මේක නම් පුදුම ආරංචියක්. අපි මේක සමරන්නම ඕන.

**පොතේ ගුරා** පිලිස්තිවරු හැමෝම, ඔවුන්ගේ දෙවියන්ගේ මාලිගාවේ රැස්වී සැම්සන්ට සිදුවුනු දේ බලා සිටියා.

**1 මිනිසා** සැම්සන්, ඔයාගේ ශක්තිය අපිට පෙන්වන්නේ නැත්තේ ඇයි ? ආහ්හ්හ්... හාහ් හහ් හා.... අපිට උද්දීපනයක් දෙන්නකෝ...

**පොතේ ගුරා** සැම්සන්ට ඇස් දෙකම නැති බව දුටු මේ ජනතාව, ඒකටත් විහිලු කරන්නට වුණා.

..........................................................................................



135Page

**පොතේ ගුරා** සැම්සන් තමුන් අසල ඉන්නවා යැයි දැණුන තරුණ කොල්ලෙක්ට කතා කළා.

**සැම්සන්** මේ ගෘහය පිහිටා තිබෙන කුළුණුවලට මා හාන්සි වන පිණිස, ඒවායේ මගේ අත තබා බලන්නට ඉඩ හරින්න.

**පොතේ ගුරා** ඒ තරුණ කොල්ලා එසේ කළ පසුව, සැම්සන් කුළුණුවලට අත් තබා මෙසේ යාච්ඤා කළා.

**සැම්සන්** දෙවියන්වහන්සේ ඔබට ප්‍රශංසා වේවා !

මේ පිලිස්තිවරුන් පරාජය කරගෙන ඔවුන් සමඟම මටත් මිය යන්නට මට තව එක අවස්ථාවක් ලබා දෙන්න.

..........................................................................................



136Page

**පොතේ ගුරා** ඔහු යාච්ඤා කර, ගෘහයේ කණු තමාගේ මුළු ශක්තියෙන් නැමුවා.

**සැම්සන්** මම ද අද පිලිස්තිවරු සමග මැරේවා !

**පොතේ ගුරා** ක්‍රාස්... ක්‍රාස්... මාලිගාවේ කුළුණු කඩා වැටී පිලිස්තිවරු සියලු දෙනාම මැරුණා. සැම්සන ජීවත්ව සිටි කාලයේදී මරපු ගණනට වඩා, ඔහුගේ මරණයේ දී මරපු ගණන වැඩිව තිබුණා.

මේ අවස්ථාවේ දී ඔහුත් පිලිස්තිවරුන් සමගම මරණයට පත් වුණා.

..........................................................................................

**ජීවිතයට අදාල කිරීම**

ආදර දුවේ පුතේ, සැම්සන් වැරදි කාන්තාවක් ආශ්‍රය කරන්න ගිහින් එයාට තිබුණ ලස්සන ජීවිතය නැති කරගත්තා.

අයියෝ ... හරිම දුකයි. ඔයාටත් කපටිකම් කරන, වැරදි දේ කරන්න ඔයාලව ගෙනියන, නරක මිතුරන් මුණ ගැහෙන්න පුලුවන්.

ඒ අයත් එක්ක එකතුවෙලා දේවල් කරන්න පටන් ගත්තොත් ඔයාවත් නාස්ති වෙයි. ඒ නිසා පරිස්සමින් ...! ඔයාගේ යාලුවන් මොනවගේ අයද කියලා හොදට හොයලා බලලා ආශ්‍රය කරන්න.